මගේ අංකය : ඩී14/ජේ.පුන.සීමිත බඳවා ගැනීම්/2025
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2026.01.27

සියළුම බන්ධනාගාර අධිකාරින් හා ,
සහකාර බන්ධනාගාර අධිකාරින් වෙත

**<u>බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ, II වන පෙළ ජේලර් හා II වන පෙළ පුනරුත්ථාපන නිලධාරී තනතුරට උසස් කිරීමේ ලිඛිත තරග විභාගය - 2025 (2026)</u>**

මෙම දෙපාර්තමේන්තුවේ II වන පෙළ ජේලර් / II වන පෙළ පුනරුත්ථාපන නිලධාරි තනතුරුවල පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ඡේද අංක 05හි දක්වා ඇති සුදුසුකම් 2025.05.31 දිනට සපුරා ඇති උපලේඛන 01 හි සඳහන් ශ්‍රේණිවල නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | |
|---|---|
| II පෙළ ජේලර් පුරප්පාඩු තනතුරු ගණන (පිරිමි) | - 28 |
| II පෙළ ජේලර් පුරප්පාඩු තනතුරු ගණන (කාන්තා) | - 04 |
| II පෙළ පුනරුත්ථාපන පුරප්පාඩු තනතුරු ගණන (පිරිමි) | - 11 |
| II පෙළ පුනරුත්ථාපන පුරප්පාඩු තනතුරු ගණන (කාන්තා) | - 03 |

02. මෙයට අමුණා ඇති ආකෘති පත්‍රයට අනුකූලව සකස් කර ගන්නා ලද අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.donets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B.Exams" ඔස්සේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026.02.09 දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර, 2026.03.09 වැනි දින ප.ව. 9.00 ට අවසන් වේ.මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 මැයි මස කොළඹදී පවත්වනු ඇත.

- අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

03. නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.මේ බව සුදුසුකම් සපුරා තිබෙන සියලු නිලධාරීන්ට දැනගැනීමට ලැබෙන පරිදි ප්‍රසිද්ධ කර ඉදිරි කටයුතු කරන්න.

04. **මාසික වැටුප් පරිමාණය :**

4.1 අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි උපලේඛන II අනුව II පෙළ ජේලර්/ II පෙළ පුනරුත්ථාපන තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය,

රු. 55,410 - 7×670- 2×890- 25×1,190- 91,630 (RS 3 – 2025) වේ.

05. සුදුසුකම් :

5.1. පළපුරුද්ද :

i. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව සුදුසුකම් පරීක්ෂා කරන දිනට පූර්වාසන්න වසර පහ(05) තුළ වැටුප් වර්ධක පහක්(05) උපයාගෙන තිබීම සහ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

ii. බන්ධනාගාර දෙපාර්තමේන්තුගත තනතුරක පහත සඳහන් උපලේඛනයේ පරිදි නියමිත සේවා කාලයක් සම්පූර්ණ කරන නිලධාරියකු විය යුතුය.

උපලේඛන 01

| තනතුර | අවශ්‍ය අඛණ්ඩ ස්ථිර සේවා කාලය අවුරුදු |
|---|---|
| 01. සැරයන් | 06 |
| 02. කර්මාන්ත පරිපාලක | 06 |
| 03. I පෙළ වෘත්තීය උපදේශක | 06 |
| 04. කෘෂිකර්ම උපදේශක | 06 |
| 05. කර්මාන්ත ෆෝමන් | 06 |
| 06. නියාමකවරු | 12 |
| 07. රියදුරු | 12 |
| 08. කෘෂිකර්ම ඕවසියර් | 12 |
| 09. ඖෂධ සංයෝජක | 12 |
| 10. II පෙළ වෘත්තීය උපදේශක | 12 |
| 11. දැනට සේවයේ නියුතු පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ඇති ඉහත ඕනෑම තනතුරක නිලධාරියකු | 05 |
| 12. සරඹ උපදේශක | 12 |

සටහන

ඉහත තනතුරු දරන නිලධාරීන් සුදුසුකම් ලැබීමට අවශ්‍ය සේවා කාලය සම්පූර්ණ කර නොමැති අවස්ථාවක ඔවුන්ගේ පූර්ව තනතුරේ සේවා කාලය වර්තමාන තනතුරට එකතු කර වසර දොළහක(12) දෙපාර්තමේන්තුගත සේවා කාලයක් සම්පූර්ණ කරයි නම් ඔවුන් ලිඛිත පරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබති.

5.2. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

5.3.වෙනත්

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුශංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
V. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 5 සිට 6 දක්වා ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

06.වයස් සීමාව: අදාළ නොවේ.

07. බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත විභාගයේදී සියලුම විෂයයන් සමත්ව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව තෝරාගනු ලැබේ.

7.1. ලිඛිත විභාගය:

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. බන්ධනාගාර ආඥා පනත හා දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | පැය 03 | 100 | 40 |
| 02. මානව හිමිකම් හා සිරකරුවන්ට අදාළ ජාත්‍යන්තර නීති රීති | පැය 02 | 100 | 40 |

7.1.1 විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. බන්ධනාගාර ආඥා පනත හා දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග | අදාළ ග්‍රන්ථ 02හි සියලුම වගන්ති |
| 02. මානව හිමිකම් හා සිරකරුවන්ට අදාල ජාත්‍යන්තර නීති රීති | ශ්‍රී ලංකා මානව හිමිකම් කවුන්සිලයේ නීති රීති හා එක්සත් ජාතීන්ගේ සිරකරුවන්ට අදාළ නීති රීති ඇතුලත්ය. |

08. කාර්යක්ෂමතා කඩඉම්:

8.1. පළමු කාර්යක්ෂමතා කඩඉම පත්වීම ලැබී වසර 03ක් තුළ (බන්ධනාගාර අඥාපනත දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග හා තරුණ වරදකරුවන්ගේ අභ්‍යාස විද්‍යාල විශෝධන විද්‍යාල ආඥාපනත, ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි හා මූල්‍ය ක්‍රම)

8.2. දෙවන කාර්යක්ෂමතා කඩඉම පත්වීම ලැබී වසර 05ක් තුළ (මානව හිමිකම් හා සිරකරුවන්ට අදාළ ජාත්‍යන්තර නීති රීති) සමත් විය යුතුය.

09. අයදුම් කිරිමේ ක්‍රමය:

9.1. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ.මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න.අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2. අයදුම්පතේ මනාපය නිසි පරිදි පැහැදිලිව සඳහන් කළ යුතු අතර, පළකරන මනාපය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9.3.අයදුම්කරු විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගත යුතු අතර විභාග දිනයේ ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ එසේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රයයි. අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට පෙනී සිටීමට අවසර නොලැබෙනු ඇත.

9.4. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී / සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

9.5. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් කිරීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුවේ.

9.6. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් විභාග දෙපාර්තමේන්තුව අමතා, අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය .විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.7.සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

10. විභාග ගාස්තු:

- විභාග ගාස්තුව රු.600/= කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතුය.
  - i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින්(Any Bank Credit Card)
  - ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු කාඩ්පතක් මගින් (Any Bank Debit Card With the Facility of Internet Transactions)
  - iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින්(Online Banking Method of Bank of Ceylon)
  - iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

සටහන:-

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක්(SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(ඇ) විභාග සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

11.අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

11.1. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපතිවරයා සෑහිමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය.ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

- ජාතික හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කරගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

12. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්:

12.1. අපේක්ෂයකුට අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට කටයුතු කෙරේ.

13.පොදු කරුණු:

13.1. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවේ. **“ විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.”**

13.2. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව හා මෙම පුරප්පාඩුව පිරවීම සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත.

13.3. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළකරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්(වැ.බ.)

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (වැ.බ.)
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.